# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1711/24 - 2011 ජුනි මස 24 වැනි සිකුරාදා - 2011.06.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව, කලින් කල සංශෝධිත අග්නිදිග විශ්ව විද්‍යාලය හා සම්බන්ධ වූ 1996 මාර්තු මස 27 වැනි දින හා අංක 916/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ නියමය සහ අවසන් වරට 2005 සැප්තැම්බර් මස 30 වැනි දින හා අංක 1412/35 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් සංශෝධිත, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි උපලේඛනය වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් :-

"උපලේඛනය

| *I වැනි තීරය* *පීඨය* | *II වැනි තීරය* *අධ්‍යයන අංශ* |
|---|---|
| කලා සහ සංස්කෘතික පීඨය | 1. සමාජ විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. භාෂා අධ්‍යයන අංශය |
| | 3. භූගෝල විද්‍යා අධ්‍යයන අංශය. |
| කළමනාකරණ සහ වාණිජ පීඨය | 1. කළමනාකරණ අධ්‍යයන අංශය |
| | 2. ගණකාධිකරණ සහ මූල්‍ය අධ්‍යයන අංශය |
| ව්‍යාපාරික විද්‍යා පීඨය | 1. ජීව විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. භෞතික විද්‍යා අධ්‍යයන අංශය |
| | 3. ගණිත විද්‍යා අධ්‍යයන අංශය. |
| ඉස්ලාම් අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය | 1. ඉස්ලාම් අධ්‍යයන අංශය |
| | 2. අරාබි භාෂා අධ්‍යයන අංශය"; සහ |

(2) 2005 සැප්තැම්බර් මස 30 වැනි දින අංක 1412/35 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ (2) වැනි අයිතමය මෙයින් ඉවත් කරනු ලැබේ.

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2011 ජුනි මස 21 වැනි දින,
කොළඹ දී ය.

07-239/4